2024.09

Learning Resource Center
R
De Mazenod College
Kandana

# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම 2024
## ඉතිහාසය - 11 ශ්‍රේණිය

I පත්‍රය විභාග අංකය ..............

කාලය පැය 01

පොදු උපදෙස්
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
- 1,2, 3, 4 පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා එම අංකය මත X ලකුණ යොදන්න.

(1) අතීත ප්‍රජාව විසින් විවිධ කාල වකවානු වල ලියන ලද ග්‍රන්ථ හෝ ලේඛන හඳුන්වන්නේ,

1. පුස්කොල පොත් ලෙසය.
2. සාහිත්‍ය මූලාශ්‍ර ලෙසය.
3. වංසකතා ලෙසය.
4. සෙල්ලිපි ලෙසය.

(2) ක්‍රි.ව හතරවන සියවසයේදී පමණ රචනා කරන ලද මහසෙන් රාජ්‍ය සමයේ අවසානය තෙක් ඓතිහාසික තොරතුරු ඇති සාහිත්‍ය මූලාශය කුමක්ද?

1. දීපවංසයයි
2. මහාවංසයයි
3. බෝධිවංසයයි
4. ථූපවංසයයි.

(3) අතීත භික්ෂූන් වහන්සේලාට ලෙන් පූජා කිරීම වාර්තා කිරීම සඳහා ලියන ලද ලිපි හඳුන්වන නාමය වන්නේ,

1. පුවරු ලිපි
2. ආසන ලිපි
3. වැම් ලිපි
4. බ්‍රාහ්මීය ලෙන් ලිපි

(4) ශ්‍රී ලංකාවේ ගල් යුගයට අයත් සාක්ෂි හමුවන ස්ථාන අතර ප්‍රථමයෙන්ම කියැවෙන ස්ථානයක් වන්නේ,

1. මාතොට
2. ඉබ්බන්කටුව
3. අලුගල්ගේ
4. රත්නපුරය

(5) මීට වසර 38000 පෙර ප්‍රාග් ඓතිහාසික මානවයාගේ වාසස්ථානයක් පැවති බවට සාක්ෂි හමුවන ස්ථානය වන්නේ,

1. පාහියන්ගල ලෙනය
2. කුරුවිට බටදොඹලෙනය
3. කිතුල්ගල බෙලිලෙනය
4. අත්තනගොඩ අළුලෙනය

- සහතින් දක්වා ඇති තොරතුරු ඇසුරින් 6 වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A ලෙන තුළ මිහිදන්කළ පුද්ගලයින් 12 දෙනෙකුගේ ඇටසැකිලි හමුවීම
B මල සිරුරු නමා වකුටු කොට වළලා තිබීම
C ආහාර පුළුස්සා අනුභව කිරීම
D හණ්මාවිශේෂ තැන්පත් කිරීම

(6) ආදි මානවයා ජීවත්වූ ජනාවාසයක් වන කිතුල්ගල බෙලිලෙන සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු කියැවෙන පිළිතුරු කාණ්ඩය වන්යේ,

1. A හා D ය.
2. A හා C ය.
3. B හා D ය.
4. C හා D ය.

(7) කිසියම් වස්තුවක් පොළවට ලම්භාකාර වීමෙන් එම වස්තුව මගින් පොළව මත ඇතිකරන පීඩනය නිශ්ක්‍රිය වන්නේය යන භෞතික විද්‍යා මූලධර්මය භාවිතා කළේ,

1. මැටි බඳුන් සෑදීමේදීය.
2. ස්ථූප ඉදිකිරීමේදීය.
3. රුවන්වැලිසෑයේ අත්තිවාරම තැනීමේදීය
4. නිවාස හා සොහොන් ගර්භ වල බිත්ති බැඳීමේදීය.

(8) පරිපාලන දිස්ත්‍රික්ක බෙදා එම දිස්ත්‍රික්ක පාලනයට ඇමතිවරු පත්කළ අනුරාධපුර යුගයේ පාලකයා වන්නේ,

1. දුටුගැමුණු රජතුමා ය
2. වසභ රජතුමා ය.
3. පණ්ඩුකාභය රජතුමා ය.
4. දේවානම්පියතිස්ස රජතුමා ය.

(9) ඉන්දියාවේ කාලිංග දේශය සමග විවාහ සම්බන්ධතා පවත්වා තම දේශපාලන බලය තහවුරු කරගත් රජෙකු වන්නේ,

1. ගජබාහු රජතුමා ය.
2. ඉළනාග රජතුමා ය.
3. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා ය.
4. පළවන විජයබාහු රජතුමා ය.

(10) ක්‍රි.ව 9 වන සියවස රචනා කරන ලද සෙල් ලිපියක "වටාපතක" සළකුණ මගින් දැක්වෙන්නේ,

1. රාජකීයත්වය
2. දීමනාවේ පවිත්‍රත්වය.
3. සදාකාලික බව
4. සෞභාග්‍යය.

(11) ක්‍රි.ව 9 වන සියවසයේ සෙල්ලිපි වල සභාව නමින් හඳුන්වා ඇත්තේ,

1. විධායකකයි.
2. ව්‍යවස්ථාදායකයයි.
3. අධිකරණයයි
4. රාජසභාවයි.

(12) හතරවන කාශ්‍යප රජතුමා අනුරාධපුරයේ දරුණු උණ රෝගයක් පැතිර ගිය අවස්ථාවේ ඒ සඳහා ප්‍රතිකාර කිරීමට තැනූ රෝහල් විශේෂය හැඳින්වූ නම වන්නේ,

1. පසවත්තිනාම ශාලා යන්නයි.
2. සොත්ථි ශාලා යන්නයි.
3. උපසග්ගරෝගනාස යන්නයි.
4. වෙජ්ජසාලා යන්නයි.

(13) හේන් වගා කිරීම වෙනුවෙන් අයකල බදු වර්ග දෙක අහෝසිකළ රජතුමා කවුද?

1. නිශ්ශංකමල්ල රජතුමා
2. පළවන විජයබාහු රජතුමා
3. පළවන පරාක්‍රමබාහු රජතුමා
4. දුටු ගැමුණු රජතුමා

(14) මන්නාරමේ පිහිටි මහාතිත්ථ වරායට ආසන්නව ඉදිකර ඇති පැරණි හින්දු කෝවිල කුමක්ද?

1. නල්ලූර් කෝවිල
2. කෝනේශ්වරම් කෝවිල
3. මුන්නේශ්වරම් කෝවිල
4. තිරුකේතීශ්වරම් කෝවිල

(15) ඉතා පුරාණ කාලයේ සිට අපේ මුතුන්මිත්තෝ යකඩ නිස්සාරණය කිරීමේ තාක්ෂණය හොඳින් දැන සිටියහ.ඒ පිළිබඳව පැරණිතම සාධක හමුවන්නේ,

1. බලංගොඩ සමනල වැව ප්‍රදේශයෙන්
2. බෙරගල ප්‍රදේශයෙන්
3. උඩරංචාමඩම ප්‍රදේශයෙන්
4. ඉබ්බන්කටුව සොහොන්බිමෙන්

(16) නූතන රන්කරුවන්ට පවා අභියෝගයක්ව ඇති මල් කැටයම් 21 සහිත වී ඇටයක ප්‍රමාණයේ රන් තැල්ලක කොටසක් හමුවී ඇත්තේ,

1. අභයගිරි කැනීම් වලින්
2. ජේතවන කැනීම් වලින්.
3. සීගිරි කැනීම් වලින්
4. මිහින්තලේ කැනීම් වලින්.

- පහත සඳහන් තොරතුරු ඇසුරින් 17 හා 18 ප්‍රශ්න වලට පිළතුරු සපයන්න.

A විශාල ජල ධාරිතාවක් දරා සිටීම.

B වැව් ජලය ප්‍රධාන ඇළට නිකුත් කිරීම.

C ශක්තිමත්ව ඉදි කිරීමට පිහිටි ගලක් හෝ කඳුගැට දෙකක් තෝරා ගැනීම.

D ගල් කුට්ටි යොදා ගංගාවක් හරස් කර ජලය වෙනත් දිසාවකට හැරවීම.

E විශාල ගල පතුරු යොදා වැව් බැම්මේ නිශ්චිත උසක තැනීම.

(17) වැව් බැම්ම හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක්ද?

1. A හා C
2. A හා D
2. 3.B හා C
4 D හා E

(18) සොරොව්ව සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක්ද?

1. A හා E
2.B හා E
3.B හා D
4.C හා D

(19) අතීත සමාජ ධුරාවලියට අනුව සමාජයේ පහළම මට්ටමේ සිටි පිරිස හඳුන්වා ඇත්තේ කුමන නමින්ද?

1. කුඩීන්
2.ප්‍රභූන්
3.භාණකවරු
4. දාසයන්

(20) පැරණි ශ්‍රී ලංකාවේ කාන්තාව විශේෂ ගෞරවාදරයට පත් වීමට බලපෑ ප්‍රභලතම සාධකය වූයේ,

1. සූප ශාස්ත්‍රය පිළිබඳ දක්ෂතා දැක්වීමයි.
2. මව්වරුන් ලෙස වගකීම් උසුලමින් කටයුතු කිරීමයි.
3. කුල සිරිතට අනුව ජීවත්වීමයි.
4. ස්වාමිපුරුෂයාගේ ගෞරවය සුරකිමින් ජීවත් වීමයි.

- පහත ප්‍රකාශ අධ්‍යයනය කොට 21 හා 22 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A බෙලිගල දළදා මැදුරක් කරවා දළදා වහන්සේ එහි තැන්පත් කරවීම
B කාලිංග මාඝ ගෙන් රට බේරා ගැනීම
C දඹදෙණිය විජයසුන්දරාරාමය කරවීම
D චන්ද්‍රභානු නම් ජාවක රජු පරාජය කිරීම
E ජෝතිය සිටුවරයාගේ කැරැල්ල මර්ධනය කිරීම
F සිංහල සංගය නම් කැරැල්ල ඇතිවීම
G වන්නි ප්‍රදේශ කෝට්ටේට යටත් කර ගැනීම

(21) ඉහත ප්‍රකාශ අතරින් තුන්වන විජයබාහු රජුගේ කාලයට අයත් සිදුවීම් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. C හා E
2.D හා F
3. A හා B
4.A හා C

(22) ඉහත ප්‍රකාශ අතුරින් හය වන පරාක්‍රමබාහු රජුගේ කාලයට අයත් සිදුවීම් මොනවාදැයි තෝරන්න.

1. A හා B
2.E හා G
3.E හා F
4.D හා F

(23) පුනරුද සමයේ නව චිත්‍ර කලාවක් බිහි කළ මධ්‍යස්ථානයක් ලෙස වැදගත්වූ නගරය කුමක්ද?

1. වැනීසිය
2.ජිනෝවා
3.රෝමය
4.ප්ලොරන්ස්

(24) ශ්‍රී ලංකාවට පෘතුගීසීන් පැමිණෙන විට යාපනයේ සිටි පාලකයා කුමක්ද?

1. සංකිලි
2. පරරාජසේකරම්
3.එදිරිමානසිංහම්
4.පුවිරාජපණ්ඩාරම්

(25) 1594 දන්තුරේ සටන මෙහෙයවූ පෘතුගීසි කපිතාන්වරයා කවුද?

1. පේරෝ ලෝපේස් ද සූසා
2.දියගෝ ද මෙලෝ
3.කොන්ස්තන්තිනු ද සා
4.ජෙරනිමෝ ද අසවේදු

(26) කාර්මික විප්ලව සමයේ මැකඩම් ක්‍රමය භාවිතා කරන ලද්දේ කුමකටද?

1. යකඩ හා වානේ නිපදවීමටය
2.දුම්රිය මාර්ග තැනීමටය.
3.පාලම් ඉදිකිරීමටය
4. මහාමාර්ග ඉදිකිරීමටය.

(27) පහත ප්‍රකාශ ඇසුරින් ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරයා හා සම්බන්ධ ප්‍රකාශ දැක්වෙන පිළිතුර කුමක්ද?

A සිවිල් නිලධාරියෙකුවූ ජෝන් ඩොයිලිගේ සහය ලබා ගැනීම

B මුත්තුසාමි කුමරු උඩරට රජු ලෙස ප්‍රකාශ කිරීම

C සෙන්පති මැක්ඩෝවල්ගේ නායකත්වයෙන් උඩරට ආක්‍රමණය කිරීම

D ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට හා ඔහුගේ ඥාතීන්ට උඩරට සිහසුනට වූ අයිතිය අහෝසි කිරීම

1. A හා B
2. B හා C
3. C හා D
4. B හා D

(28) උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයන්ට යටත්වූ බව නිළ වශයෙන් පිළිගත් ඓතිහාසික ගිවිසුමේ හතරවන වගන්තියෙන් කියවෙන්නේ,

1. රජුට හා රජුගේ ඥාතීන්ට සිංහාසනයට තිබූ අයිතිය අහෝසි වීම.
2. රදළයින් සතු වරප්‍රසාද හා අයිතිවාසිකම් හිමි වන බව.
3. බුද්ධ ශාසනය හා දේවාලගම් ආරක්ෂා කරන බව.
4. උඩරට රාජ්‍යයේ අධිකරණය පවත්වාගෙන යන ආකාරය පිළිබඳව.

(29) 19 වන සියවස ශ්‍රී ලංකාවේ ඇතිවූ ආගමික හා සංස්කෘතික ප්‍රබෝධය හා සම්බන්ධ අදහස් යුගල කිපයක් පහත දැක්වේ. ඒවායින් නොගැළපෙන යුගලය තෝරන්න.

1. පංච මහා වාද - මීගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
2. මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙන - හික්කඩුවේ සුමංගල හිමි
3. උදයභානු පුවත්පත ආරම්භ කිරීම - ආරුමුග නාවලර් තුමා
4. කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවීම - ටී. බී ජයා මහතා

(30) වර්ච් මිෂනාරි සංවිධානය විසින් පළ කරන ලද ප්‍රකාශනය මින් කුමක්ද?

1. ලක්මිණිපහන
2. මාසික තෑග්ග
3. ලංකා ලෝකය
4. සරසවි සඳරුස

(31) යුරෝපීය ව්‍යාපාරිකයින් විසින් ගෙන ගිය ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ උද්ඝෝෂණ වල ප්‍රධාන අරමුණ වූයේ මින් කුමක්ද?

1. වතු වගාවට අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කර ගැනීම
2. ආණ්ඩුකාරයාගේ බලතල සීමා කර ගැනීම
3. ව්‍යවස්ථාදායකයේ නිළ නොලත් පිරිස වැඩි කර ගැනීම
4. ව්‍යවස්ථාදායකයේ ජනවර්ග නියෝජනය අහෝසි කර ගැනීම

(32) ශ්‍රී ලංකාවේ තේ වගාවට උචිත නොවූ ප්‍රදේශය මින් කුමක්ද?

1. වියළි කලාපය
2. කඳුකර තෙත් කලාපය
3. තෙත් උස් කඳුකර කලාපය
4. තෙත් කලාපය

(33) පොපි මල් ව්‍යාපාරයට එරෙහිව වාමාංශික පක්ෂ නායකයින් ආරම්භකල සූරියමල් ව්‍යාපාරය තුළින් ලැබූ මුදල් යොදවනු ලැබුවේ,

1. බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ගේ පවුල් වලට ආධාර පිණිසය
2. බ්‍රිතාන්‍යයට පක්ෂපාතී බව පෙන්වීමට පෙළපාලි හා උත්සව සඳහාය.
3. ලංකා නිදහස් සටනට දායකත්වය දැක්වීම සඳහාය
4. ලාංකික දුප්පත් ජනයාගේ සුභ සිද්ධිය සඳහාය.

(34) මෙරට වෘත්තීය සමිති ව්‍යාපාරය තුළ ලංකා කම්කරු සංගමය පිහිටුවීමේ පුරෝගාමියා වූයේ,

1. එස්.ඒ වික්‍රමසිංහ මහතා ය.
2. ඒ.ඊ ගුණසිංහ මහතා ය.
3. නටේස අයියර් මහතා ය.
4. පිලිප් ගුණවර්ධන මහතා ය.

2024.09

# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම 2024
# ඉතිහාසය - 11 ශ්‍රේණිය
# II පත්‍රය

Learning Resource Center
R
De Mazenod College
Kandana

විභාග අංකය ..............................................

කාලය පැය 03

පොදු උපදෙස්.
- I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකටද, III කොටසින් එක් ප්‍රශ්නයකටද පිළිතුරු සැපයිය යුතුය. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

1. අ. i. පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.
නල්ලූර්, නාච්චදූව වැව, තිරුකේතීශ්වරම්, මින්නේරි වැව, කුරුණෑගල, ගන්නෝරුව, කළු ගඟ, මැණික් ගඟ, ඉබ්බන්කටුව, ගොඩවාය, කෝට්ටේ, ලංකා පටුන (ලකුණු 12)

ii. පහත සඳහන් සියළුම ස්ථාන සපයා ඇති ලෝක සිතියමෙහි ලකුණු කර නම් කරන්න.
පෘතුගාලය, ඕලන්දය, මලක්කා සමුද්‍ර සන්ධිය, මද්‍රාසිය, මධ්‍යධරණී මුහුද, ජපාන දූපත්,
(ලකුණු 06)

ආ. i. පහත A,B,C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට අදාල පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A තම සටන පෞද්ගලික රජ සැප පිණිස නොව, එය බුද්ධ ශාසනයේ යහපත උදෙසා සිදු කරන්නක් බව ප්‍රකාශ කළ රජතුමා

B දැදිගම සූතිඝර චෛත්‍යය ඉදිකරුනු ලැබුයේ කවර රජෙකුගේ උප්පත්තිය සිහි කිරීම පිණිසද?

C මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය පිළිබඳව තොරතුරු සොයා ගත්තේ කවුද?

D ලංකාවට පැමිණි පළමු පෘතුගීසි ජාතිකයා කවුද? (ලකුණු 04)

ඇ. A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



A

1.A රූපයෙන් නිරූපනය වන්නේ කුමක්ද?

2. එය සෑදූ රජතුමා කවුද?

3. එය පිහිටා ඇත්තේ කොහේද?

4. මෙය නිර්මාණය කිරීමට යොදා ඇති ද්‍රව්‍යයක් නම් කරන්න



B

1. B රූපය නම් කරන්න.

2. මෙය කාගේ නිර්මාණයක් ද?

3. මෙය යුරෝපයේ කවර ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ද?

4. මෙම නිර්මාණය නිසා දියුණුවට පත් ක්ෂේත්‍රය කුමක්ද?

(ලකුණු 08)

II කොටස

2. i. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත්වූ එළිමහන් වාසස්ථාන 3 නම් කරන්න.
ii. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ආහාර රටාවේ මූලික ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 03)
iii. පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ තාක්ෂණික දැනුම උඩරංචාමඩම කැනීම් වලින් අනාවරණය කරගත් තොරතුරු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 04)
iv. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ලකුණු 06)

3. i. අනුරාධපුර යුගයේදී මහා වාරිමාර්ග පද්ධති නිර්මාණය කිරීම සඳහා යොදා ගත් ගංගා තුනක් නම් කරන්න.
ii. A සිට D දක්වා ඇති ප්‍රකාශ වලට ගැළපෙන පිළිතුර ලියන්න. (ලකුණු 03)

A - සෙල් ලිපි වල වාරි කර්මාන්ත හා සම්බන්ධ නිලධාරියා හඳුන්වා ඇති නම

B - මින්නේරිය හා කවුඩුල්ල යන වැව් වලට ජලය ගෙන ගිය ඇළ මාර්ගය හැඳින්වූ නම

C - වැවක රොන් මඩ ඉවත් කිරීමට හැකි වන පරිදි වැව් බැම්මේ පහළ මට්ටමේ ඉදි කර ඇති විවරය කුමක්ද?

D - වියළි කලාපයේ පානීය ජලයේ නියමිත ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීමට ළිඳ තුල බිත්ති ආවරණයට යෙදූ උපක්‍රමය කුමක්ද?

iii. පුරාණ ශ්‍රී ලංකාවේ යකඩ නිස්සාරණය කළ බවට සාධක හමුවන ස්ථාන දෙකක් නම් කර, එහි යකඩ නිස්සාරණය සිදුවූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)
iv. අතීතයේදී මිනුම් ක්‍රම භාවිතා කළ ක්ෂේත්‍ර තුනක් දක්වා එහි භාවිතා කළ මිනුම් පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ලකුණු 06)

4. i. අතීතයේදී අය කළ පහත සඳහන් බදු වර්ග සෙල්ලිපි වල හැඳින්වූ ආකාරය වරහන තුලින් තෝරා ලියන්න.

A - ඇළ මාර්ග වල මකසායින් ඇල්ලීම වෙනුවෙන් අය කල බදු වර්ගය

B - වැව් වල ජලය භාවිතා කරන්නන්ගෙන් අය කළ බද්ද

C - රජුට අයත් ඉඩම් වල වගා කිරීම වෙනුවෙන් අය කළ බද්ද

(දකපති, කැතිඅඩ, බොජකපති, මතෙරමපිබක)

ii. අතීත ජනයා ආහාර සඳහා බහුලව භාවිතා කල ධාන්‍ය වර්ග හතරක් ලියන්න. (ලකුණු 03)
iii. ලෙඩ රෝග වලට ගොදුරුවීම වළක්වා ගැනීමට අතීත ආහාර රටාවෙන් ලබා ගත හැකි ආදර්ශ දෙකක් පෙන්වා දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)
iv. පරිසරය ආරක්ෂා කර ගැනීමට අතීත රජවරු ගත් ක්‍රියාමාර්ග කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ලකුණු 06)

5. i. මහනුවර රාජධානි සමයේ රජතුමා විසින් විසඳන ලද නඩු වර්ග තුනක් ලියන්න. (ලකුණු 03)

ii. මහනුවර ආර්ථිකයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. මහනුවර පාලන සමයේ දෙවන රාජසිංහ රජතුමා මුහුණදුන් අභියෝග දෙකක් සඳහන් කර එය ජයගත් ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv මහනුවර සමාජයේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

6. i. බ්‍රිතාන්‍ය පාලන සමයේ මධ්‍යසාර භාවිතයට එරෙහිව විවිධ මාධ්‍ය මගින් ජනතාව දැනුවත් කළ පුද්ගලයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

ii. දහනමවන සියවස අගදී බෞද්ධ පාසැල් පිහිටුවීමට පෙරමුණ ගෙන ක්‍රියා කළ නායකයින් හතර දෙනෙකු නම් කරන්න. (ලකුණු 04)

iii. අමදාස සංවිධාන රටපුරා ව්‍යාප්තවීම නිසා ඇතිවූ ප්‍රතිඵල දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

iv. 1833 පසුව කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා හරහා ලංකාවේ පරිපාලනයේ ඇතිවූ වෙනස්කම් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

7. i. පහත සඳහන් සිද්ධීන් හා සම්බන්ධ පුද්ගලයින් අනුපිළිවෙලින් ලියන්න

A - 1908 යටත් විජිත ලේකම්ට විධිමත් පෙත්සමක් ඉදිරිපත් කිරීම

B - 1912 ව්‍යවස්ථාදායක සභාවට උගත් ලාංකික මන්ත්‍රීවරයා ලෙස තේරී පත්වූ පුද්ගලයා

C - ලංකාවේ නිදහස් ව්‍යාපාරය ශක්තිමත් කිරීම සඳහා 1927 දී ලංකාවට පැමිණි ඉන්දියානු නායකයා (ලකුණු 03)

ii. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ බ්‍රිතාන්‍ය රාජ්‍ය නිළධාරීන් වෙත පැවති විෂය ක්ෂේත්‍ර 2 ක් ද, ශ්‍රී ලාංකික අමාත්‍යවරුන්ට පැවති විෂය ක්ෂේත්‍ර දෙකක් ද ලියන්න. (ලකුණු 04)

iii. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමයෙන් සර්වජන ඡන්ද බලය ප්‍රධානය කිරීම නිසා ඇතිවූ ප්‍රතිඵල දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. බ්‍රිතාන්‍ය පාලනය නිසා මෙරට ඇතිවූ සමාජ වෙනස්කම් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

## III කොටස

8. i. පුනරුද සමයේ ඉතාලියේ බිහිවූ ගත්කතුවරුන් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

ii. පුනරුද සමය හා සම්බන්ධ පහත ප්‍රශ්න වලට පිළිතුරු අනුපිළිවෙලින් ලියන්න.

A - පියෙටා ප්‍රතිමාවේ නිර්මාපකයා

B - ඉන්දියාවේ කැලිකට් වරායට 1498 දී ගොඩබට නාවිකයා

C - සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සූර්යයා වටා ඉලිප්සාකාර මාර්ගයක ගමන් ගන්නා බව සොයාගත් පුද්ගලයා

D - ගුරුත්වාකර්ෂණ නියමය සොයාගත් පුද්ගලයා (ලකුණු 04)

(ලියනාඩෝ ඩාවින්චි, මයිකල්ආන්ජලෝ, බර්තොලමියු ඩියස්, වස්කෝ ද ගාමා, ජොහැන්නස් කෙප්ලර්, නිකලස් කොපර්නිකස්, අයිසැක් නිවුටන්, ගැලිලියෝ ගැලිලි)

iii. පුනුරුදයේ ගෝලීය ප්‍රවණතාවයන් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. පුනුරුදයේ බලපෑමෙන් ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවූ වෙනස්කම් තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

9 i. බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවයත් සමග රෙදිපිළි කර්මාන්තයේ දියුණුවට බලපෑ නව නිමැයුම් තුනක් ලියන්න. (ලකුණු 03)

ii. කාර්මික විප්ලවයට සමගාමීව කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ විශාල වර්ධනයක් ඇතිවීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. කාර්මික විප්ලවයේ බලපෑම නිසා සන්නිවේදන ක්ෂේත්‍රයේ ඇතිවූ දියුණුව නිදසුන් දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

iv. බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවයෙන් ආර්ථික ක්ෂේත්‍රයට ඇතිවූ යහපත් ප්‍රතිඵල දෙකක් හා සමාජයට ඇතිවූ අයහපත් ප්‍රතිඵල එකක් විස්තර කරන්න. (ලකුණු 06)



REGISTRAR
De Mazenod College
Kandana.


N